# CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


## විනිශ්චයකාරවරුන්ගේ ව්‍යවස්ථාපිත විශ්‍රාම යාමේ වයස වැඩි කිරීමට ගත් කැබිනට් තීරණය පිළිබඳව ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ ප්‍රකාශය

විනිශ්චයකාරවරුන් විශ්‍රාම යන වයස දීර්ඝ කිරීම මගින් හඳුන්වා දීමට නියමිත අධිකරණ සංඛ්‍යාව සහ අභියාචනාධිකරණවල කලාපීය ක්‍රියාකාරිත්වය වැඩිවීම හේතුවෙන් අධිකරණවලට පළපුරුදු හා උගත් විනිසුරුවරුන්ගේ සේවය ලබා ගත හැකිය යන තර්කය ඉදිරිපත් කරමින්, විනිශ්චයකාරවරුන්ගේ දැනට පවතින විශ්‍රාම යන වයස දීර්ඝ කිරීමට, 2026 ජූලි 27 දින ප්‍රකාශයට පත් කරන ලද මෑත කාලීන කැබිනට් තීරණය පිළිබඳව අපගේ අදහස ප්‍රකාශ කිරීමට ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ලෙස අපි කැමැත්තෙමු.

මෙම තත්ත්වයන් යටතේ, අප දේශය තුළ අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය සහ බලතල බෙදී යාමේ මූලධර්මය පවත්වාගෙන යාම සහ ආරක්ෂා කිරීම සැම විටෙකම අතිශය වැදගත් වන බව, ශ්‍රී ලංකා රදගුරු සම්මේලනය ප්‍රකාශ කර සිටින්නේ ය. ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය තමන් අතර නිසි සම්බන්ධතාවය පවත්වා ගත යුතු බව කතෝලික සභාවේ සමාජ ධර්මය පිළිගන්නා අතර, අධිකරණයට, ස්වකීය වගකීම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ස්වාධීනත්වය සහතික කිරීමේ අවශ්‍යතාවය එය විශේෂයෙන් තහවුරු කරයි (Compendium of the Social Doctrine of the Church, Paragraph 402).

එබැවින්, ස්වාධීන අධිකරණයක් යනු මේ රටේ සියලුම පුරවැසියන්ගේ යුක්තිය, මානව ගරුත්වය, මූලික අයිතිවාසිකම් සහ පොදු යහපත ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය ආරක්ෂාවකි. ඒ අනුව මේ අවස්ථාවේ දී සිදුකිරීමට යෝජිත එවැනි ව්‍යවස්ථා සංශෝධනයක අනිවාර්ය ඉලක්කය විය යුත්තේත්, එය ක්‍රියාත්මක කළ යුත්තේත් මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය තවදුරටත් ශක්තිමත් කරන ආකාරයෙන් බව ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ප්‍රකාශ කර සිටින්නේ ය.

එබැවින්, විනිසුරුවරුන්ගේ දැනට පවතින ව්‍යවස්ථාපිත විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමේ මෙවැනි ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කළ යුත්තේ, පළපුරුදු විනිසුරුවරුන් රඳවා ගැනීමේ අරමුණින්, අධිකරණ නිලධාරීන්ගේ සමස්ත හිඟය සම්බන්ධයෙන් මේ රටේ පැන නැග ඇති මූලික ගැටළු ඵලදායී ලෙස විසඳීමේ අරමුණින් සහ නඩු විසඳීමේ අනවශ්‍ය ප්‍රමාදයන් විසඳීමේ අරමුණින් යුතුව බව, ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය කරුණු විමසා බැලීමෙන් පසුව, එළැඹි අදහසයි. එසේම එවැනි ක්‍රියා මාර්ගයන් ගැනීමට පෙර පොදු ජනතාවගේ සහ අදළ පාර්ශවයන්ගේ ප්‍රමාණවත් උපදෙස් විමසුමක් සිදුවිය යුතුය යන්නත් ශ්‍රී ලංකා රදගුරු සමුළුවේ අදහසයි.

✠ අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණෝ
සභාපති
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය

CATHOLIC BISHOPS' CONFERENCE
SRI LANKA

✠ අති උතුම් ඇන්ටන් රංජිත් හිමිපාණෝ
මහලේකම්
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය

2026 අගෝස්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා